# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,653—1959 ජනවාරි 27 වැනි අඟහරුවාද—27.1.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**සී282 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ)**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මිල (ආහාර) පාලක තැන්පත් කොටුවේ මුහන්දිරම් ධර්මසේන ජයනෙත්ති වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිල (ආහාර) පාලක තැන කෙරෙහි පැවරී තිබෙන බලතල අනුව—

(i). 1958 අගෝස්තු 11 වෙනි දින අංක 11,472 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද 1958 අගෝස්තු 11 වෙනි දින අංක සී 275 දරණ ආහාර මිල නියෝගයේ උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උපලේඛනයේ 2, 3 සහ 4 වෙනි තීරවල පිළිවෙලින් දක්වෙන පිටරටින් මෙරටට බඩු ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිලද, තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිලද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිලද, මෙම නියෝගයෙන් 1959 පෙබරවාරි 1 වෙනි දින සිට අවලංගු කරමි.

(ii) තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර හොණ්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර රාත්තලක්ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් තුළ විකිණිය හැකි වැඩිම මිල 1959 පෙබරවාරි 1 වෙනි දින සිට මේ උපලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිල අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(iv) එසේම කොළඹ නගරයේ නාගරික සීමාවන් තුළ උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(v) තවද, කොළඹ නගරයේ නාගරික සීමාවන් තුළ යම් ස්ථානයක හෝ වාහනයක උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුට මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(vi) එසේම, මෙම නියෝගයේ කාර්ය සඳහා " රාත්තල " හෙවත් " රා. " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(vii) එසේම, කොළඹ නගරයේ නාගරික සීමාවන් තුළ උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම මිලයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්.:

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය (බර) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද, සිල්ලර වශයෙන් ද යන වග, ඇතුළත් කුයිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(viii) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිලත් උපලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිල ගණන් වලට ඇතුළත්වී ඇති බවද නියම කරමි.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
මිල (ආහාර) පාලක,

1959 ජනවාරි 27 දින පෙරවරු 9.15 ට කොළඹදී අත්සන් තබන ලදී.

## උපලේඛනය

| 1 වෙනි තීරය විස්තරය | 2 වෙනි තීරය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිල රු. ශ. | 3 වෙනි තීරය සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිල රු. ශ. |
|---|---|---|
| උම්බලකඩ (සියළුම වර්ගවල) ... ... | 240 0 ... | 2 40 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

අංක එච් 26 දරණ ආහාර මිළ නියෝගය. වී.

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

#### නියෝගය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිළ පාලක තැන්පත් තම්බයියා සිවඥනම් වන මම, 3(2) වගන්තිය හා කියවෙන 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) 1958 ජූලි මස 8 වන දින අංක 11,417 දරණ ලංකාණ්ඩුවේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක එච් 24 හා 1958 ජූලි 2 දින දරණ මිළ නියෝගය 1959 ජනවාරි 5 දින සිට අවලංගු කරමි.

(ii) 1959 ජනවාරි 5ද සිට මීට යාකර ඇති 1 වන උපලෙඛනයේ 2 වන තීරයේ දක්වෙන මිළ, එම උපලෙඛනයේම පළමුවන තීරයේ දක්වෙන පෙදෙස්වල වී තොග වශයෙන් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ වන අතර, ඒ මිළට වඩා ඒ පෙදෙස්වල නො විකිණිය යුතු බව නියෝග කරමි.

(iii) 1959 ජනවාරි 5 වනද සිට මීට යාකර ඇති 2 වැනි උපලෙඛනයේ 2 වන තීරයේ දක්වෙන මිළ එම උපලෙඛනයේම 1වන තීරයේ දක්වෙන පෙදෙස්වල වී සිල්ලරට ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ වන අතර, ඒ මිළට වඩා ඒ පෙදෙස්වල නො විකිණිය යුතු බව නියෝග කරමි.

(iv) තවද, මෙම නියෝගයේ කාය්‍ය සඳහා—

(අ) මොනම වී ප්‍රමාණයක් වුවත්, පරිභෝගය සඳහා හෝ පාවිච්චිය සඳහා හෝ විකිණීමක් වුවහොත් එම විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් බව ගණන් ගත යුතු බවත්;

(ආ) මොනම වී ප්‍රමාණයක් වුවත්, යළිත් විකිණීමක් සඳහා විකිණීමක් වුවහොත්, ඒ විකිණීම තොග වශයෙන් විකිණීමක් බැව් ගණන් ගත යුතු බවත්;

(ඇ) ''රාත්තල'' හෙවත් ''රා.'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර අනුව සම්මත රාත්තලේ බර බවත්;

(ඈ) වී ඕනෑම ප්‍රමාණයක් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධබර හොණ්ඩරයකට අඩු හෝ වැඩි හෝ වූ විට එම වී ප්‍රමාණයට ගෙවිය යුතු වැඩිම මිළ මෙම නියෝගයෙන් නියමකරනු ලැබූ ශුද්ධබර හොණ්ඩරයක මිළ අනුව ගණන් බලා සකස් කරගත යුතු බවත් නියෝග කරමි.

(v) වෙන ද්‍රව්‍යයන් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකරන ලද වී කිසිවෙකු විසින් නො විකිණිය යුතු බව නියෝග කරමි.

(vi) වී විකිණීමේදී එම වී යම් දෙයක ඔත්තු හෝ අසුරනු හෝ ඇති නම් එකී මිළ ද මේ නියෝගයෙන් වී වලට නියම කරන ලද වැඩිම මිළ බවද නියම කරමි.

(vii) මේ නියෝගයෙන් වැඩිම මිළ නියම කරන සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් යම් වාහනයක හෝ සිය ස්වාමිත්වයේ හෝ සිය පාලනය යටතේ හෝ වී තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙක් ම මේ නියෝගයෙන් ඒ ප්‍රදේශයට නියම කරන වැඩිම මිළ සඳහන් කරන දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියෝග කරමි.

(viii) සිල්ලර වශයෙන් වී විකුණන සෑම කෙනෙකුම සහ තොග වශයෙන් වී විකුණන සෑම කෙනෙකුම්, මිළ දී ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් දෑ අඩංගු කුවිතාන්සියක් ඔහුට දියයුතු බව නියෝග කරමි :—

(අ) විකුණූ දිනය;

(ආ) (බර අනුව) විකුණූ ප්‍රමාණය ;

(ඇ) විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල, හා

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය එනම්, වෙළෙඳාම තොග වශයෙන් ද නැති නම් සිල්ලර වශයෙන්ද.

1959 ජනවාරි 23 වන දින ප. ව. 2ට හම්බන්තොට දී අත්සන් කරන ලදී.

ටී. සිවඥනම්
නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන.
පරිපාලන දිස්ත්‍රික්කය, හම්බන්තොට.

### පළමුවන උපලේඛනය

| 1 වන තීරය ප්‍රදේශය | 2 වන තීරය තොග වශයෙන් විකිණීමේදි ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම මිළ රු. ශ. |
|---|---|
| 1. කංගල්ල ... ... ... ... | 10 22 |
| 2. ඉබලිඅත්ත ... ... ... ... | 10 28 |
| 3. මහවෙල ... ... ... ... | 10 35 |
| 4. දෙද්දුවාවල ... ... ... ... | 10 36 |
| 5. වලස්මුල්ල ... ... ... ... | 10 37 |
| 6. වීරකැටිය ... ... ... ... | 10 44 |
| 7. කිරම ... ... ... ... | 10 46 |
| 8. කටුවන ... ... ... ... | 10 48 |
| 9. මිද්දෙනිය ... ... ... ... | 10 42 |
| 10. හම්බන්තොට ... ... ... ... | 10 60 |
| 11. අම්බලන්තොට ... ... ... ... | 10 49 |
| 12. තිස්ස ... ... ... ... | 10 84 |
| 13. රන්න ... ... ... ... | 10 60 |
| 14. ඉහත සඳහන් නොවූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනික් සෑම ප්‍රදේශයකම | 10 22 |

## දෙවන උපලේඛනය

| 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක වැඩිම මිළ<br>(අ)<br>රාත්තලක හෝ ඊට අඩු සියලුම ගනුදෙනුවලට රාත්තලක මිළ<br>ශත | <br><br>(ආ)<br>වරකට රාත්තලට වැඩි සියලුම ගනුදෙනුවලට රාත්තල් 2 ක මිළ<br>ශත |
|---|---|---|
| 1. රකව, තංගල්ල, උනාකුරුව, වල්ගම්එළිය, මාරකොල්ලිය, තේ නගම, කදුරුපොකුණ, පොළොන් මාරුව, සිටිනාමළුව, වගේගොඩ, බෙලිඅත්ත, ගොඩවෙල, කහවත්ත, පුවක්දන්ඩාව, දම්මුල්ල, ඉහළ බෙලිගල්ල, පහළ බෙලිගල්ල, පල්ලත්තර, පට්ටියවෙල, සියඹලාගොඩ, වහරක්ගොඩ, තාරපේරිය, ගැටමාන්න උතුර, ගැටමාන්න දකුණ, කුඩා හීල්ල, මහ හීල්ල, සහ පලපොත යන ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... ... ... | 9½ ... | 19 |
| 2. බෝවල, ගලහිටිය, හොරවෙල, ඉත්තදෙමළිය, කඩිගමුව, තලහගම්වාඩුව, වලස්මුල්ල, දළුවක් ගොඩ, කණුමුල්දෙණිය නැගෙනහිර, කණුමුල්දෙණිය දකුණ, කණුමුල්දෙනිය බටහිර, මොදර වාන, වාව්ව, යටිගල, කුඩාවැල්ල නැගෙනහිර, කුඩාවැල්ල බටහිර, සීනිමෝදර, නාකුළුගමුව බටහිර, නාකුළුගමුව නැගෙණහිර, දෙද්දුවාවල, අම්බල සහ ගලගම යන ගම්මුළාදෑනි කොට්ඨාශ | 9½ ... | 19½ |
| 3. බැදිගම, බුද්දියාගම, ගෝනදෙනිය, මන්ඩාඩුව, මූකිරිගල, යක්ගස්මුල්ල, කිංචිගුනේ, හීල්ගෙඅයන, වල්ගම්මුල්ල, වෙළදගොඩ, රදනිආර, බූකැන්දයාය, හොරවින්න, ජුලම්පිටිය, ගඟුලන්දෙනිය, කටුවන, රුක්මල්පිටිය, සියාරපිටිය, තල්වත්ත, සහ උඩගොමඩිය යන ගම්මුළාදෑනි කොට්ඨාශය | 9½ ... | 19½ |
| 4. හඳුගල, වරාපිටිය, පාතෙගම සහ පිහලැල්ල යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... | 10 ... | 20½ |
| 5. මිද්දෙනිය, හල්ලල, සපුගහයාය, ලබුහේන්ගොඩ, මෙල්ලකැටිගොඩ, මුරුන්ගස්යාය, වැලිපිටිය, කුඩාගල්ආර, කුඩාගොඩ, තලාව, දෙබොක්කාව, දබරැල්ල සහ ඕකන්දෙයාය ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 9½ ... | 19½ |
| 6. අබේසේකරගම, උස්වැව සහ සියඹලාකොටේ යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... | 9½ ... | 19½ |
| 7. වැලිපටන්විල, මීණිඇතිලිය, මාමඩල, නවාලූවිල, ලුනම, බැමිණියන්විල, හාතගල, වාඳුරුප්ප, බෝලාන, බැරගම, වලවෙ, ඇත්බටුව, බටඅත, පල්ලෙගම, අඟුණුකොළපැලැස්ස, මූලන සහ කොග්ගල්ල යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... ... | 9½ ... | 19½ |
| 8. හම්බන්තොට නගර සභා කොට්ඨාශය ... ... ... ... | 9½ ... | 19½ |
| 9. බුන්දල, ගොන්නෝරුව, කොහොලන්කල, ඉහළකුඹුක්වැව, සහ වැලිවැව, යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 10 ... | 20 |
| 10. රනකෙලිය දකුණ, රන්කෙලිය උතුර, උඩුවිල, තිස්ස උතුර, තිස්ස දකුණ, සහ වීරවිල යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... ... ... ... | 10 ... | 20 |
| 11. මත්තල සහ අඟුණකොළවැව යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... ... | 10 ... | 20½ |
| 12. කිරින්ද සහ මාගම යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... ... ... | 10 ... | 20½ |
| 13. ජූලමුල්ල, පට්ටියපොල, උඩයාල, හීන්බුන්න, දහඅමුණ, හකුරුවෙල, මැදගොඩ, විතාරන්දෙනිය සහ වකමුල්ල යන ගම්මුලාදෑනි කොට්ඨාශ ... ... ... | 10 ... | 20 |
| 14. ගුරුපොකුණ, නෙටොල්පිටිය, විගමුව සහ කහඳාමෝදර යන ගම්මුළාදෑනි කොට්ඨාශ ... | 9½ ... | 19½ |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් වී විකිණීමේ නියමිත මිළ නොවේ. මේ එම වී විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. මේ මිළ ගණන් වලට ඉහළින් වී විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී